# ශ්‍රී ලංකා නිදහස් පක්ෂය
# ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சி
# SRI LANKA FREEDOM PARTY

සභාපති : මෛත්‍රීපාල සිරිසේන
தலைவர் : மைத்ரிபால சிறிசேன
President : Maithripala Sirisena

ප්‍රධාන ලේකම් : නීතිඥ දයාසිරි ජයසේකර
பிரதான செயலாளர் : தயாசிறி ஜயசேகர (சட்டத்தரணி)
Secretary : Dayasiri Jayasekara (Attorney-at-Law)

භාණ්ඩාගාරික : නීතිඥ දුෂ්මන්ත මිත්‍රපාල
பொருளாளர் : துஷ்மந்த மித்ரபால (சட்டத்தரணி)
Treasurer : Dushmantha Mithrapala (Attorney-at-law)


2023 මැයි 12

ශ්‍රී ලංකාවේ 06 වන විධායක ජනාධිපති
ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ගරු සභාපති,
අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා,
ශ්‍රී ලංකා නිදහස් පක්ෂ මූලස්ථානය,
අංක 301, ටි.බි.ජයා මාවත,
කොළඹ 10,

ගරු සභාපතිතුමනි,

**<u>"ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විනාශ කරන වර්ථමාන ලේකම්වරයාගේ ක්‍රියාකළාපය හෙළා දකිමු" යන හිසින් යුතුව පාර්ලිමේන්තු මන්ත්‍රී දුමින්ද දිසානායක මහතා ඔබතුමා වෙත යොමු කර ඇති ලිපිය සම්බන්ධවයි.</u>**

උක්ත හිසින් යුතුව 2023 මැයි 09 දාතමින් ඔබතුමා ආමන්ත්‍රණය කර පක්ෂයේ ඉදිරිපෙළ ක්‍රියාකාරින්ටද පිටපත් සහිතව නිකුත් කර ඇති ලිපිය පිළිබඳව මාගේ ස්ථාවරය ඉදිරිපත් කරනු කැමැත්තෙමි.

මෙම ලිපිය දුටු විගස මා විසින් තේරුම්ගත් කරුණ වුයේ, එම ලිපිය ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ශක්තිමත්ව නැගිසිටින සෑම අවස්ථාවකදිම පක්ෂය දුර්වල කිරීමට සහ පක්ෂය භේදබින්න කරවා පක්ෂය බිදවැටිම තුළින් පක්ෂය සමග සතුරු ජාතික සහ විජාතික බලවේග ශක්තිමත් කර ඒ තුළින් තමන්ගේ පටු පුද්ගලික ලාභ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනිම සඳහා ඕනෑම අශ්ලීල, දීන, පහත් ක්‍රියාවක් සඳහා පෙළඹවන දේශපාලන අනාථයකුගේ සිහින් කෙදිරිල්ලක් බවයි. අප පක්ෂයේ සියළු මට්ටම් වල ක්‍රියාකාරීකයින්ගේ දායකත්වයෙන් සාර්ථක මැයි දිනයක් පවත්වා ඉන් ලැබූ පන්නරය තුළින් පිබිදුන පාක්ෂිකයන්ගේ මනස නැවත වියවුල් කර උකටලි කිරිම සඳහා වන තවත් තුච්ච, නිහීන, පියවරක් ලෙස මෙම ලිපිය තේරුම් නොගැනීමට තරම් අප පක්ෂයේ ඉහලම තලය නියෝජනය කරන දේශපාලන මණ්ඩලය, මධ්‍යම කාරක සභාව සහ ඉහල නායකත්වය සහ පක්ෂයේ සෙසු තලයන් නියෝජනය කරන පාක්ෂිකයන් අඥබාලයන් සේ සලකා කටයුතු කිරීම හාස්‍යජනකය. මෙම ලිපියේ කතෘවරුන්ගේ සහ එහි පිටුපස සිටින කණ්ඩායමේ සැගවුණ උත්සාහය සහ පක්ෂය විනාශ කිරිමේ කූට අරමුණ ඉටුකර ගැනීම සඳහා ඔවුන් දක්වන ක්‍රියාකාරිත්වය පිළිබදව පසුගිය කාලය පුරාම ඔබතුමා මා හා අප පක්ෂයේ තිරණ ගන්නා කණ්ඩායම් සමග නිරන්තරව සාකච්ඡා කරමින් දැනුවත් කරමින් අවදියෙන් සිටින ලෙස කරන ලද අනතුරු ඇගවීම් මේ මොහොතේ යථාර්තයක් සේ ඉස්මතු ව ඇති බව සිහිපත් කළ යුතුය.


301, ටී.බී. ජයා මාවත, කොළඹ 10. 301, டி.பி. ஜயா மாவத்தை, கொழும்பு 10. 301, T.B. Jayah Mawatha, Colombo 10.
දුරකථන : மின்னஞ்சல Tel: +94 011 2680125, +94 011 2680126, +94 011 2680127, +94 011 2680128, +94 011 3138118
ෆැක්ස් : பெக்ஸ் : Fax: +94 011 2680187 විද්‍යුත් තැපෑල : E-mail: slfphqrs@gmail.com

පක්ෂයේ වර්තමාන ලේකම්වරයා ලෙස මා පක්ෂය විනාශ කිරීම සඳහා කටයුතු කරමින් සිටිනවා යැයි ඒත්තු ගැන්වීම සඳහා මෙම ලිපිය මගින් අසාර්ථක උත්සාහයක යෙදෙන බව ලිපියේ අන්තර්ගතය සහ ලිපියේ අභිලාශය මගින් පක්ෂයේ සබුද්ධික සාමාජිකත්වය වෙතම ප්‍රකට කර ඇති බව මාගේ වැටහීම වේ. ඉතා සිල්ලර ලෙස ඔවුන් විසින්ම මෙහෙයවා ඇති කරන ලද අර්බුද කිහිපයක් හුවා දක්වමින් එම මතය සනාථ කිරීම සඳහා ගන්නා අසාර්ථක උත්සාහයන්ට ප්‍රතිඋත්තර දීම සඳහා මා කාලය වැය කල යුතු නොවේ.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආරම්භයේ සිට මේ දක්වාම මා ද ඇතුළුව සේවය කළ ප්‍රධාන ලේකම්වරුන් පක්ෂයේ ප්‍රගමනයටද, විනාශයටද දී ඇති දායකත්වය පිළිබඳව අවශ්‍ය නම් බොහෝ කරුණු මා හට ඉදිරිපත් කල හැකි බවද ඔබතුමාට සහ පක්ෂ සාමාජිකත්වය වෙත මා විසින් සිහිපත් කළ යුතුය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් කැපවුණ දේශපාලන පවුලකින් දේශපාලනයට පිවිස, ප්‍රාදේශිය සභාවෙන් ඇරඹි ක්‍රියාකාරි දේශපාලන ගමනක් හිමි, පක්ෂයේ තරුණ සංවිධානයේ ලේකම් ලෙසත් පත්ව, පළාත් සභාව, පාර්ලිමේන්තුව නියෝජනය කරමින් ඉදිරියට පැමිණ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂ වැනි දැවැන්ත දේශපාලන පක්ෂයක ප්‍රධාන ලේකම් ධුරය හොඹවන මා හට එකී ඉතිහාසය පිළිබඳව පරිපූර්ණ කියවීමක් ඇති බව අවධාරණය කරන අතරම, අප පක්ෂයේ ලේකම්වරුන්ගේ කැපවීම, සංවර්ධනාත්මක දායකත්වය සේම, පාවාදීම් ඉතිහාස කථා පිළිබඳව ද මා මෙන්ම පක්ෂයේ ඉහල නායකත්වයේ සිටම, සමස්ත සමාජිකත්වයමද, මුලු රටමද, විටින් විට අත්දැක ඇති බව සැගවිය නොහැකි ප්‍රකට කරුණකි. අවශ්‍ය මොහෙතේ දි ක්‍රියා නොකිරීමද, අනවශ්‍ය මොහොතේ දි ක්‍රියා කිරිමද තුළින් නියමින් හෝ අනියමින් සෘජුවම හෝ වක්‍රව පක්ෂයේ විනාශය සඳහා ඔවුන් ලබාදුන් දායකත්වය පිළිබඳව අවශ්‍ය ඕනෑම මොහොතක ඉතා සාධනීය ලෙස පක්ෂ සමාජිකත්වය සහ  මෙරට සබුද්ධික ජනතාව වෙත කරුණු සහිතව සම්පූර්ණ ප්‍රස්තුතය ඉදිරිපත් කිරිම සඳහා මම නොතිත් බලාපොරොත්තුවෙන් පසුවෙමි.

මෙම ලිපියෙන් ද මීට පෙර වෙනත් අයුරින්ද මා සුජාත ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයකු නොවන බවට වන කරුණු දැක්වීම පිළිබඳවද මාගේ අවධානය යොමු වේ. මුලින් කි පරිදි මා උපන්ගෙයි ශ්‍රීලංකාකාරයෙකි. එපමණක්ද නොව ආරම්භයේ සිටම ජයග්‍රහණ අත් කර ගත් පක්ෂය තුළ ජයග්‍රාහකයෙකි. එසේ වුවද මා පක්ෂයෙන් පන්නා ගනු ලැබුවේ අද මෙම ලිපියේ කතෘවරුන්ටද මගපෙන්වන මෙම පක්ෂයේම අතීත නායකාරකාදීන්ද ඔවුන්ට වන්දිබට්ටකම්කරන දේශපාලන අඳබාලයන් පිරිසක්ම බව සිහිපත් කරනු කැමැත්තෙමි. එම පිරිස වෙනුවෙන් මෙම ලිපිය ලියන පිරිස් ඔබතුමා විනාශ කිරීම සඳහා කොතරම් වන්දිබට්ටකම් සිදුකරනු ලබන්නේද යන්න කරුණු ඇතිව දුමින්ද දිසානායක මහතාද අසල සිටියදි ඔබතුමා විසින්ම ප්‍රකාශ කළ බව දුමින්ද දිසානායක මහතාද සහභාගි වු අන්තිම මධ්‍යම කාරක සභා රැස්වීමේදි ඔබතුමා සහ දුමින්ද දිසානායක මහතා අතර සිදුවු සංවාදය සිහියේ ඇති සැමට හොඳින් මතකය.

ඉතා පහත් පළිගැනිම් තුළ මා පක්ෂයෙන් ඉවත්ව ගියද 2013 වසරේ මා නැවත මෙම පක්ෂයට පැමිණියේ පක්ෂය පරාජිත මානසිකත්වයක සිටින අවස්ථාවකදි වුවා සේම වයඹ පළාත් සභා මැතිවරණය හරහා මෙම පක්ෂයට දැවැන්ත ජයග්‍රහණයක් අත් කර දෙන්නට මා හට හැකියාවක් ලැබුනේ පක්ෂයට නව ජීවයක් එක් කරමිනි. එතැන් සිට මේ දක්වාම මාගේ ආදරණිය පක්ෂයේ උන්නතිය සඳහා මා කරන ලද මෙහෙය පිළිබද ආවර්ජනය කිරිමට ඔබට භාර කරන්නෙමි. මාගේ මෙම දෙවන ආගමනයේ සිට මේ දක්වා කාලය තුළ පක්ෂයේ උන්නතිය සහ අභිවෘද්ධිය සඳහා මාගෙන් ලද දායකත්වය හා කැප කිරිම මෙන්ම ඉතා දුෂ්කර අවස්ථා වලදි පවා පක්ෂයේ නායකයා කවරෙක් වුවද පක්ෂයේ දේශපාලන මණ්ඩලයේ, මධ්‍යම කාරක සභාවේ ප්‍රතිපත්ති තිරණ සහ මතවාද අනුල්ලංගනීය ලෙස ආරක්ෂා කර ස්ථාපනය කිරිම සඳහා මා දෙන ලද දායකත්වයට පක්ෂය වෙනුවෙන් කැපවුන ඔබතුමා ද ඇතුළුව අවංක සමාජිකයන් සාක්ෂි දරනු ඇත. එහෙත් අතීතයේ සමහර ලේකම්වරුන්ට එළෙස ශුද්ධ ප්‍රකාශයක් කළ නොහැකි බව මා හා පක්ෂය පමණක් නොව සමස්ථ දේශයම දනී. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සමහර නායකකාරකාදීන් විවිධ අවස්ථා වලදි ගන්නා ලද අදුරදර්ශි ක්‍රියාමර්ග නිසා මෙන්ම හා පැවැති තත්ත්වයන් පිළිබඳව හොඳ අවබෝධයක් තිබුණද අවශ්‍ය මෙහොතේ දි තිරණ නොගැනීම මත අන් බලවේග සහ දේශපාලන කඳවුරු පෝෂණය වන්නට ඉඩහැර බලාසිටි අදුරු අතිතයක්ද අපට හිමිය. ඒවායේ නරක ප්‍රතිවිපාක අප පක්ෂය අද ද අත්විඳමින් සිටි. ඒ සියළු දුර්වලතාවයන් මාගේ පිටමත පැවරීමට දරණ උත්සාහයන් මා අවඥාවෙන් හා පිළිකුලෙන් යුතුව බැහැර කරමි.

ඔබතුමාට ලිපිය යොමු කරමින් හා විවිධ පිරිස් හරහා බලපැම් කරමින් පක්ෂය හා එහි අනාගතය පිළිබඳ කිඹුල් කඳුළු හෙලන්නන් අදවන විට දේශපාලන අනාථයන් බවට පත්ව තිබේ. මෙම ලිපියද එම පිරිසට එම අනාථභාවයෙන් මිදීම සහ දේශපාලන සුජාතභාවය ලබා ගැනීම සඳහා දරණ ලද තවත් ජුගුස්සාජනක උත්සාහයක් විනා අන්කවරක්වත් නොවේ. පක්ෂයේ දේශපාලන මණ්ඩලයේ සහ මධ්‍යම කාරක සභාවේ තීරණ පක්ෂයේ සමාජික පොදු මතය හා මඟපෙන්වීම් පිළිනොගනිමින් පක්ෂයේ නායකයා ලෙස පක්ෂ දේශපාලන මණ්ඩලයේ සහ මධ්‍යම කාරක සභාවේදි ඔබ විසින් දෙන ලද උපදෙස් පවා අළුයම ලු කෙලපිඩක් සේ බැහැර කරමින් පක්ෂයේ නායකයා ලෙස ඔබ කරුණු පැහැදිලි කරද්දි ඔබට පිටු පා නැගිට ගිය, එහෙත් මෙම ලිපියෙන් ඔබ චාමර පවන් සලමින් වර්ණනා කරන පිරිස් දයාසිරි මත වැරදි පටවා නැවත අප කඳවුරු තුළ නැංගුරම් දැමිමට කැසකවන අයුරු හාස්‍යය ජනකය. තමා හා තම කණ්ඩායම කරන ලද වරද පිළිගෙන නැවත පක්ෂය හා එක්වීමට තරම් නිහතමානිභාවක් නොමැතිව විවිධ උපක්‍රම තුළින් පක්ෂය තුළ බලය තහවුරු කර ගැනීමටද ඉන් පසුව ඔවුනට කැමති දෙසකට මෙම පක්ෂය මෙහෙයවිමටද දරන ලද උත්සාහය පරාජය කිරිම සඳහා ඔබතුමා ගන්නා ක්‍රියාමාර්ගය දෙස මා ද ඇතුළුව පක්ෂයේ දේශපාලන මණ්ඩලය, මධ්‍යමකාරක සභාව ඇතුළුව ඉහල සිට පහල දක්වා සමාජිකයන්ද විමසිලිමත්ව බලා සිටින බව අවධාරණය කරනු කැමැත්තෙමි. පක්ෂයේ ලිපි ශිර්ෂයන් භාවිතා කරමින් ද, එය භාවිතා කිරීමට හේතු ඉදිරිපත් කරමින් ද, දුමින්ද දිසානායක මහතා දරණ උත්සාහයේ සැගවුණ අරුත තේරුම් ගැනීමට තරම් ඔබතුමා ප්‍රඥාවන්ත වනවාද යන්න පිළිබදව හා ඉදිරියේදි ඒ පිළිබදව ගනු ලබන ක්‍රියාමාර්ග දෙස මා සමග පක්ෂයේ දේශපාලන මණ්ඩලය හා මධ්‍යමකාරක සභාවද අවධානයෙන් සිටින බව ප්‍රකාශ කරනු කැමැත්තෙමි.

2023 පළාත් පාලන මැතිවරණය සඳහා අප සන්ධානයක් ගොඩනැගුවේ ඇයිද යන්න හා ඒ සඳහා අප කරන ලද සංවාද ප්‍රමාණය පිළිබඳව මුළුමනින්ම දන්නේ මා හා ඔබතුමා පමණි. එම සන්ධානය ගොඩනැගිම සඳහා පක්ෂය විසින් කවර හෝ කැපකිරිමක් කළ යුතු බව ඔබතුමා විසින්ම පක්ෂයේ දේශපාලන මණ්ඩලය වෙත වාර දෙකකට වැඩි අවස්ථා ගණනකදි අවධාරණය කළ බවද ඉන් පසුව එම යෝජනාව ඔබතුමාගේ නායකත්වය යටතේ මධ්‍යමකාරකසභා අනුමැතියට යොමු කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනිම සඳහා මා වෙත පැවරූ පසු එම සන්ධානය ගොඩනැගිම සඳහා වන සියළු අභියෝග ජය ගනිමින් එය භූමියේ යථාර්තයක් බවට පත් කිරිමට මා කටයුතු කළ බව පමණක් මේ මොහොතේදි හුවා දක්වමි. එසේ හෙයින් අප විසින්ම සාකච්ඡා වට කිහිපයක් පවත්වා උත්සවශ්‍රීයෙන් ගිවිසුම් අත්සන් කර අප පක්ෂ කාර්යාලය තුළම ගොඩනගන ලද සන්ධානය අත්හැර වෙනත් මගක් නිල නොවන මට්ටමින් ක්‍රියාත්මක කිරිමට කටයුතු කළේ ඇයිද යන්නට පිළිතුරු දීම දුමින්ද දිසානායක මහතාගේ චෝදනාවට ලක්ව තිබෙන මා විසින්ම සිදුකිරිම යුක්ති යුක්ත නොවන අතර එම කරුණු දැක්වීම ඔබතුමා විසින් සිදුකරනු ඇතැයි මා බලාපොරොත්තු වෙමි.

මෙම ලිපියේ සඳහන් කරුණු පිළිබඳව ඔබතුමාගේ විවෘත සහ ඍජු ප්‍රතිචාරය මා බලාපොරොත්තුවෙන් සිටින අතර ඒ පිළිබඳ කඩිනම් ප්‍රතිචාරයක් නොලැබෙන්නේ නම් දුමින්ද දිසානායක මහතාගේ ලිපියට අදාලව ඉතා දීර්ඝ කරුණු පැහැදිලි කිරිමක් අප පක්ෂයේ ආදරණීය සංවිධායකවරුන්, සංවිධායකවරියන් හා අනුබද්ධ සංවිධානවල නියෝජිතවරුන් මෙන්ම පක්ෂයේ පහලස්ථරයේ සියළු දෙනා වෙත සත්‍ය කරුණු සහිතව යොමු කිරිමට මා හට සිදුවන බව කාරුණිකව ඔබතුමා වෙත දන්වා සිටිමි.

ස්තුතියි.

මෙයට - විශ්වාසි,

නිතිඥ, දයාසිරි ජයසේකර (පා.ම)
ප්‍රධාන ලේකම්
ශ්‍රී ලංකා නිදහස් පක්ෂය
අංක 301, ටි.බි.ජයා මාවත,
කොළඹ 10

**නිතිඥ, දයාසිරි ජයසේකර (පා.ම)**
**ප්‍රධාන ලේකම්**

පිටපත් - 01 සියළු දේශපාලන මණ්ඩල සමාජිකයන් වෙත.
- 02 සියළු මධ්‍යම කාරක සභිකයන් වෙත.
- 03 ගොණුවට